# ලංසු සඳහා ආරාධනයයි

## විභාග දෙපාර්තමේන්තුව

## ලිපිකවර හා දුඹුරු කඩදාසි එක් වසරක කාල සීමාවක් සඳහා සැපයීමේ ප්‍රසම්පාදනය

### කොන්ත්‍රාත් අංකය : 4/10/01/2018

01. විභාග කොමසාරිස් ජනරාල් වෙනුවෙන්, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ, සභාපති විසින් පහත වගුවේ විස්තර කර ඇති පරිදි, ලිපිකවර හා දුඹුරු කඩදසි සැපයීමේ ප්‍රසම්පාදනය සඳහා මතු දැක්වෙන අවම පළපුරුද්ද සහිත යෝග්‍යතා පූර්ත හා සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින්, මුද්‍රා තබන ලද ලංසු දැන් කැඳවනු ලැබේ. විස්තර, ලංසු ලිපිලේඛනවල අන්තර්ගත කර ඇත.

| Lot No. | Type | No. of items in the Lot |
|---|---|---|
| 1 | 8" x 5" Manila Window Envelope (GSM 70) Printed | 300,000 (300 packets of 1000 Nos.) |
| 2 | 9" x 4" Manila Window Envelope (GSM 70) Printed | 2,000 (2 packets of 1000 Nos.) |
| 3 | 15" x 10" Sack Craft Envelope - Printed (GSM 80) | 450,000 (450 packets of 1000 Nos.) |
| 4 | 10.5" x 7.5" Sack Craft Envelope - (GSM 80) Printed | 150,000 (150 packets of 1000 Nos.) |
| 5 | 19.5"x16.5" Brown Sack Craft Double Envelope (GSM 80) - Printed | 50,000 (50 packets of 1000 Nos.) |
| 6 | 30" x 40" Brown Sack Craft Paper (GSM 80) | 65,000 (260 packets of 250 Nos.) |
| 7 | 30" x 40" Brown Sack Craft Paper (GSM 100) | 12,500 (50 packets of 250 Nos.) |

දෙපාර්තමේන්තුවේ, විභාග කොමසාරිස් ජනරාල්වරයා වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත වගුවේ විස්තර කර ඇති චිත්‍ර හා වර්ණ කඩදාසි සැපයීමේ ප්‍රසම්පාදනය සඳහා මතු දැක්වෙන අවම පළපුරුද්ද සතු යෝග්‍යතාපූර්ණ හා සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලංසු දැන් කැඳවනු ලැබේ. සම්පූර්ණ විස්තර ලංසු ලිපිලේඛනයේ ඇතුළත් කර ඇත.

02. ජාතික තරගකාරීත්ව ලංසු ක්‍රියාපටිපාටිය යටතේ (NCB) ලංසු කරණය පවත්වනු ලැබේ.

03. අදාළ කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා ලංසුකරු අසාධු ලේඛන ගත නොවී තිබිය යුතු අතර, ඔහු කාර්යාලයීය ලිපිද්‍රව්‍ය සැපයීම පිළිබඳව වසර තුනක පළපුරුද්දක් සපුරා තිබිය යුතුය.

04. අභිලාෂීය ලංසුකරුවනට අවශ්‍ය වැඩිමනත් තොරතුරු විභාග දෙපාර්තමේන්තු ගොඩනැගිල්ලේ, 3 වන මහලේ සැපයුම් කොට්ඨාසයෙන් (දුරකථන අංක 0112785219) ලබාගත හැකි අතර, 2018.09.05 දින දක්වා කාලය තුළ රජයේ වැඩකරන දිනවල පෙ.ව. 09.00 ත් ප.ව. 03.30 ත් අතර සාමාන්‍ය කාර්යාල වේලාව තුළදී ලංසු ලේඛන ගාස්තු ගෙවීමකින් තොරව පරීක්ෂා කර බැලිය හැක.

05. 2018.09.05 දින ප.ව. 03.00 ට ප්‍රථම එක් ලංසු කට්ටලයක් වෙනුවෙන් ආපසු නොගෙවන රු. 3,000/- ක ලංසු ගාස්තුවක් ගෙවා ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් සමග ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කර සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් විභාග දෙපාර්තමේන්තුවේ සැපයුම් කොට්ඨාසයෙන් අභිලාෂී ලංසුකරුවන්හට ලබාගත හැක.

06. ඉදිරිපත් කරන ලංසු පත්‍රිකා දින 90 ක් වලංගු විය යුතුය.

07. සෑම ලංසු පත්‍රිකාවක් සමගම ලංසු ලේඛනවලට අමුණා ඇති ආකෘතිය මගින් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මකව පවතින පිළිගත් වාණිජ බැංකුවකින් ලබාගන්නා ලද ශ්‍රී ලංකා රුපියල් හැත්තෑ පන්දහසක (ශ්‍රී ලංකා රු. 75,000.00) ක් වටිනා කොන්දේසි විරහිත, ලංසු භාරගන්නා අවසන් දින සිට දින 120 ක් වලංගු වන ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කළ යුතුය.

08. ලංසු 2018.09.06 වන දින ප. ව. 2.30 ට හෝ ඊට පෙර බත්තරමුල්ල, පැලවත්ත, විභාග දෙපාර්තමේන්තුවේ, 03 වන මහලේ සැපයුම් අංශය වෙත ගෙනැවිත් භාරදිය යුතුය. ප්‍රමාද ලංසු විවෘත නොකොට ආපසු එවනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ පසු ඉහත ලිපිනයෙහිදී පැමිණ සිටින ලංසුකරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේදී ලංසු විවෘත කරනු ලැබේ.

09. නිසි පරිදි සම්පූර්ණ කරන ලද ලංසු ලිපිකවරයේ වම් ඉහළ කෙළවරේ **"ලිපිකවර හා දුඹුරු කඩදාසි සැපයීමේ ප්‍රසම්පාදනය 2018"** කොන්ත්‍රාත් අංක 4/10/1/2018 යනුවෙන් සඳහන් කොට ඉදිරිපත් කළ යුතුය.

10. යම් ලංසුවක් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ සහ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට පෙර ඕනෑම වේලාවක ලංසු ක්‍රියාවලිය අවලංගු කොට සියලු ලංසු ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතුවේ. මෙහිදී ප්‍රතික්ෂේපිත ලංසුකරු හෝ ලංසුකරුවන් කෙරෙහි කිසිදු වගකීමක් හෝ ප්‍රසම්පාදන කමිටුවේ මෙම ක්‍රියාමාර්ගය සඳහා හේතු දැක්වීමේ බැඳීමක් හෝ දෙපාර්තමේන්තුවට, ප්‍රසම්පාදන කමිටුවට ඇති නොවේ.

**විභාග කොමසාරිස් ජනරාල්,**
**විභාග දෙපාර්තමේන්තුව,**
**පැලවත්ත, බත්තරමුල්ල.**
**2018-09-16**